සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# භූගෝල විද්‍යාව

6 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 පරිපාලන ධූරාවලිය අනුව ........................................................................ කීපයක් එකතු වී පළාත සෑදී තිබේ.
(ග්‍රාම නිලධාරී කොට්ඨාස / දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස)

02 ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය ........................................................................ වේ.
(දිස්ත්‍රික්කය / ගම / පළාත)

03 ඌව පළාත බදුල්ල හා ........................................................................ දිස්ත්‍රික්ක වලින් සමන්විත ය.
(අම්පාර / කෑගල්ල / මොණරාගල)

04 පාසලක අනන්‍යතාවය දැක්වීම සඳහා එහි නම ලිවීමේ දී .................................................. නම ද භාවිතා කරයි.
(රටේ / ගමේ / අධ්‍යාපන කලාපයේ)

05 වයඹ පළාතට කුරුණෑගල හා ........................................................................ දිස්ත්‍රික්කය ද අයත් ය.
(ගම්පහ / මහනුවර / පුත්තලම)

- අං 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 නැගෙනහිර හා දකුණු දිශාව අතර ගිණිකොන දිශාව පිහිටා ඇත. ( )

07 පාසලේ සැලැස්ම ඇඳීමට අප භාවිතා කරන්නේ චිත්‍ර වේ. ( )

08 කාලය හා ප්‍රදේශය අනුව කාලගුණික තත්වය වෙනස් වේ. ( )

09 නුවරඑළිය උණුසුම් කාලගුණය සහිත ප්‍රදේශයකි. ( )

10 උෂ්ණත්වය හා සුළං කාලගුණික අංගවලට අයත් ය. ( )



LIVEWORKSHEETS

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ශ්‍රී ලංකාවේ කාලගුණ වාර්තා සකස් කරනු ලබන්නේ,

(1) ඒ ඒ ප්‍රදේශවලට ගොස් තොරතුරු නිරීක්ෂණයෙනි.

(2) දෛනිකව රැස්කරගන්නා කාලගුණික තොරතුරු මගිනි.

(3) සෑම ස්ථානයකින්ම ලබාගන්නා උෂ්ණත්වය මගිනි.

(4) සෑම ස්ථානයකින්ම ලබාගන්නා වර්ෂාපතනය මගිනි.

12 අධික උෂ්ණත්වයක් හා සූර්ය තාපයක් පවතින ප්‍රදේශයක් ලෙස දැක්විය හැක්කේ මින් කවරක් ද?

(1) නුවර එළිය (2) මහනුවර (3) මන්නාරම (4) කෑගල්ල

13 වලාකුළු නිර්මාණය වන ආකාරය කෙරෙහි බලපාන්නේ මින් කවර කරුණ ද?

(1) ජල වාෂ්ප ඝනීභවනය (2) වර්ෂාපතනය

(3) අධික උෂ්ණත්වය (4) සූර්ය තාපය අධික වීම

14 වර්ෂාව ඇතිවීමට පෙර තත්වයක් ලෙස හඳුනා ගත හැක්කේ මින් කවර සිදුවීමක් ද?

(1) ජලය ගලායාම. (2) උෂ්ණත්වය අධික වීම.

(3) අහස අඳුරු පැහැයක් ගැනීම. (4) පරිසරය නිශ්චලව පැවතීම.

15 වර්ෂාමානයක් ඇසුරින් මනින ලද යම් ස්ථානයක වර්ෂාපතන අගය නිවැරදිව දක්වා තිබෙන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) මිලි ලීටර 750 (2) මිලි ග්‍රෑම් 750 (3) මිලි මීටර 750 (4) සෙන්ටිමීටර් 750

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති ඡේදයේ හිස්තැන් මත ලියන්න.**

ශ්‍රී ලංකාවේ 16 ................................................................ කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත. එයට සම්බන්ධ 17 ............................................... රැසක් දිවයින පුරා පිහිටා ඇත. එය මගින් විවිධ ස්ථානවල 18 .................................................. පිළිබඳව දෛනිකව රැස්කර ගන්නා තොරතුරු පදනම් කරගෙන කාලගුණ වාර්තා සකසනු ලැබේ. 19 ...................................................... මගින් පරිසරයේ උෂ්ණත්වය මැනීමට හැකිවන අතර 20 ................................................ අංශක වලින් එය මනිනු ලැබේ.



LIVEWORKSHEETS